# ජේ.ආර්. ජයවර්ධන 116 වැනි ජන්මදින සැමරුම අද

■ අංජුල මහික වීරරත්න

**ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතාගේ 116 වැනි ජන්ම දින සමරුම අදට (17) යෙදී ඇත.**

වර්ෂ 1906 සැප්තැම්බර් මස 17 වැනි දින කොළඹ සේදවත්ත වලව්වේදී උපත ලද ජයවර්ධන මහතා හිටපු විනිසුරුවකු වූ රාජ නීතිඥ ඊ.ඩබ්ලිව්. ජයවර්ධන මහතාගේ සහ හෙලේනා ඇග්නස් විජයවර්ධන යුවළගේ දරුවන් එකොළොස් දෙනා අතර වැඩිමහලු දරුවා ලෙස උපත ලැබීය.

ඔහු නීති විද්‍යාලයට ඇතුළත්ව නීතිය හදරා නීතිඥයකු වශයෙන් වෘත්තීය ජීවිතයට පිවිස ඇත.

1943 දී පැවති කැලණිය අතුරු මැතිවරණයට ඉදිරිපත්ව ජය ලබා රාජ්‍ය මන්ත්‍රීවරයකු බවට පත්වූ ජේ. ආර්. ජයවර්ධන මහතා එක්සත් ජාතික පක්ෂය ආරම්භ කරන සමයේ පක්ෂයේ සම භාණ්ඩාගාරික ධූරයට පත්ව ඇත.

1947 මහ මැතිවරණයේ දී කැලණිය මහජන මන්ත්‍රීවරයා වශයෙන් පත්ව එම වසරේ පිහිටු වූ නව රජයේ ප්‍රථම මුදල් ඇමැතිවරයා ලෙස දිවුරුම් දුන් ඔහු 1947 සිට 1954 දක්වා වසර 07ක් මුදල් ඇමැති පදවිය හෙබවීය.

1970 මහ මැතිවරණයෙන් දිනා දකුණු කොළඹ මන්ත්‍රීවරයා වශයෙන් පත් වූ ජයවර්ධන මහතා 1970 සිට 1977 දක්වා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේත්, ජාතික රාජ්‍ය සභාවේත් විපක්ෂ නායකවරයා වශයෙන් කටයුතු කළේය. 1973 වසරේ එජාප නායක හිටපු අගමැති ඩඩ්ලි සේනානායක මහතාගේ අභාවයෙන් පසු එක්සත් ජාතික පක්ෂ නායකත්වයට පත් වූයේ ද ජේ. ආර්. ජයවර්ධන මහතාය.

1977 මහ මැතිවරණය ජයගෙන ලංකාවේ 7 වැනි අගමැතිවරයා වශයෙන් පත්වූ ජයවර්ධන මහතා 1978 වසරේ සම්මත වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා බවට පත් විය.

ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා පදනම් ආයතනය, කොළඹ ක්‍රමය, නිදහස් වෙළෙඳ කලාප, කඩිනම් මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය, සංස්කෘතික ත්‍රිකෝණය, රැකියා බැංකු ක්‍රමය, වගා නිලධාරීන් පත් කිරීම, දිළිඳු සහන වැඩපිළිවෙළ, ශ්‍රී ජයවර්ධනපුරය ලංකාවේ පාලන අගනගරය කිරීම, නව පාර්ලිමේන්තු මන්දිරය පිහිටුවීම, ජාතික පුෂ්පය, ජාතික වෘක්ෂය, ජාතික පක්ෂියා ආදී සලකුණු රටට හඳුන්වාදීම ඔහුගේ පාලන කාලයේ ක්‍රියාත්මක වූ ජයවර්ධන චින්තනයේ ප්‍රතිඵල ලෙස සටහන් වේ.

1988 වසරේ දී දේශපාලනයෙන් සමුගත් ජයවර්ධන මහතා මීට වසර 26 කට පෙර එනම් 1996 නොවැම්බර් පළමු දින දිවංගත විය.